# ඔන්චිලි වාරම් කවි ගායනය



ඔන්චිලි වාරම් කවි ගායනය කරනු ලබන්නේ ඔන්චිලි පැදීම ආශ්‍රිතවයි. ගැමි ජනතාව අතර ඔන්චිලි වාරම් කවි ජනප්‍රිය වී ඇත්තේ අලංකාර නාද මාලාවකින් යුක්ත වන නිසාය. ඔන්චිලි පැදීමේ අවස්ථාව අනුව කවි නිර්මාණය වී ඇත. සරළ මෙන්ම සංකීර්ණ නාද මාලාවන්ගෙන් යුක්තය.

ඔන්චිලි වාරම් කවි ගායනයේදී ..,

- නිවැරදි නාද මාලාව
- හඬ පාලනය
- නිවැරදි වචන උච්චාරණය
- භාව ප්‍රකාශනයෙන් යුක්ත බව

පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

අවුරුදු උත්සව කාලයට ඔන්චිලි වාරම් කවි ඇසෙන්නට ලැබේ. මෙය ජාතික සංස්කෘතික ගායන අංගයක් ලෙස අගය කළ යුතුය.

ඔන්චිලි වාරම් කවි පහත දැක්වේ.



1. පුරවර මැද බැඳි රන් ඔන්චිල්ලා
   දුර යන තරමට පුදුම නොවෙල්ලා
   වැර සර පිරිමිනි තව පැදපල්ලා
   සුරපුර දෙවියන් රකු මෙ සියල්ලා

2. ඉඳ ගත්තෙමි සොඳ පුටුවක ගුවනා
   බැඳ ගත්තෙමි ජය කොණ්ඩය මුදුනා
   ඇඳ ගත්තෙමි වතකුත් ආභරණා
   යැද ගත්තෙමි නාරායන සරණා